## දැන්වීමයි.

## ඉගෙනුම් ද්‍රව්‍ය රචනා කිරීම සඳහා ලේඛකයින් බඳවා ගැනීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන ඉගෙනුම් ද්‍රව්‍ය රචනා කිරීම සඳහා සුදුසු ලේඛකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
පාසල් විෂයමාලාවට අදාළ විෂය (ඇමුණුම 1) ක්ෂේත්‍රවල ප්‍රවීණතාවක් ඇති, ලේඛන හැකියාව හා පළපුරුද්ද සහිත පහත සඳහන් ක්ෂේත්‍රවල සේවය කරන හෝ සේවය කර ඇති පුද්ගලයින්ට අයදුම් කළ හැකි ය.

- විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්
- අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්
- විෂය ප්‍රවීන වෘත්තීයවේදීන් (වෛද්‍ය, ඉංජිනේරු , තාක්ෂණ ශිල්පින් වැනි )
- ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්
- ගුරු උපදේශකවරුන්
- ගුරු සේවයේ වසර 05කට වැඩි ඉගැන්වීමේ පළපුරුද්ද සහිත, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (PGDE) සම්පූර්ණ කළ උපාධිධාරී ගුරුවරුන්,
  හෝ
  වසර 08කට වැඩි ඉගැන්වීමේ පළපුරුද්ද සහිත ඇති පුහුණු ගුරුවරුන්/ විද්‍යාපීඨ ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරී ගුරුවරුන්
- විෂය ප්‍රවීණ සම්මානලාභී ලේඛකයින්

මේ සමඟ ඉදිරිපත් කර ඇති “Application Form for Resource Persons for Writing Learning Materials” සම්පූර්ණ කර 2026.05.31 දිනට පෙර epddevelopmentbranch@gmail.com යන විද්‍යුත් ලිපිනයට හෝ "අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

තැපැලෙන් අයදුම්පත් යොමු කරන විට, කවරයේ ඉහළ වම් කෙළවරේ “ලේඛකයින් බඳවා ගැනීම - (ඉල්ලුම් කරන අදාළ විෂය)” ලෙස පැහැදිලි ව සඳහන් කළ යුතුය.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2026.04.29